# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 ජූලි මස 09 වැනි සිකුරාදා - 2021.07.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**අංක 2,235 - 2021 ජූලි මස 02 වැනි සිකුරාදා ගැසට් පත්‍රයේ පළ වූ තනතුරු - ඇබෑර්තු**

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

1.0 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 ඔක්තෝබර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර අදාළ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ, වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) කවරයේ වම් පස ඉහළ කෙළවරේ "රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2021" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.08.03 වැනි දින වේ.** මෙම විභාගය 2021 ඔක්තෝබර් මස පවත්වනු ලබන අතර ලැබෙන්නා වූ අයදුම්පත් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් පවත්වන ස්ථාන තීරණය කරනු ලැබේ. (විභාගය, උපලේඛනය - II හි දක්වා ඇති නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ. එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර අයදුම්පතේ විභාගයට පෙනී සිටින නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - II අනුව නිවැරදිව සඳහන් කළ යුතුය.)

සටහන .- අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

2.0 (අ) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමේ දී, සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකින් පසු තෝරාගනු ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ. ඔහුගේ තීරණය අවසන් තීරණය වනු ඇත. විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම දක්වා ඇත.

(ආ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

3.0 භාෂා මාධ්‍ය .- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.0 සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :

(i) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2053/18 සහ 2018.01.09 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

(ii) මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු අතර, එය තනතුරේ ස්ථිර කිරීම සඳහා වන කොන්දේසියකි.

(iii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව තෝරාගනු ලබන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු අනුව, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත් වේ.

(iv) පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධරයකු ස්ථාන මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(v) රාජ්‍ය භාෂාව .- රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතුය. දෙවන රාජ්‍ය භාෂාව - පත්වීම් ලැබ වසර තුනක් (03) ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව ඒ පිළිබඳව ප්‍රවීණතාව ලබාගත යුතුය.

(vi) රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ නිලධාරින්ගේ සාමාන්‍ය රාජකාරි වේලාව අවුරුද්දේ සියලුම දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ. එහෙත් රාජකාරි අවශ්‍යතාව මත හා රාජකාරි ස්වභාවය අනුව ඉහත වේලාවන් වෙනස් විය හැක. තවද රාත්‍රී සේවයේ යෙදීම අනිවාර්ය වන අතර, රාජකාරි ස්වභාවය අනුව අමතර රාජකාරි සඳහා ද නියෝග කරනු ලැබිය හැකිය. එමෙන්ම වසරේ දින තුන්සිය හැට පහේම (365) සේවයට යටත් වනු ඇත.

(vii) සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරන රාජකාරි ඉටුකරන මෙම නිලධාරින් විසින් රුපියල් 5,000ක ඇප තැන්පතු මුදලක් තැබිය යුතුය.

(viii) සේවා අවශ්‍යතාව අනුව සෞඛ්‍ය ආයතන හා රෝහල්වල සේවයේ නියුතු නිලධරයන් හට සෙනසුරාද, ඉරිද හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කිරීමට නියම කළ හැක. ඒ වෙනුවෙන් අතිකාල හෝ නිවාඩු දින වැටුප් හෝ හිලව් නිවාඩු ලබා ගත හැක.

5.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 47,990ක් වේ. වැටුප් කේත අංකය MN-02-2016 වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම් ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. රු. 31,940 වැටුප් පියවරෙන් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද රු. 35,790 වැටුප් පියවරෙන් ඔබ්බට යාම සඳහා I ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය. මීට අමතරව රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

6.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුවේ. තව ද වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුවේ. මේ සම්බන්ධව රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

7.0 මෙම තනතුරට අයදුම් කිරීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

7.1 මූලික සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩිවිය යුතුය. (ඒ අනුව 2003.08.03 වැනි දිනට හෝ ඊට පෙර හා 1991.08.03 වැනි දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් හෙබි අයකු විය යුතුය.

(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.2 **අධ්‍යාපන සුදුසුකම් :**

(අ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

සැ.යු. - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021.08.03 වැනි දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8.0 දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරාගැනීම :

(අ) දිස්ත්‍රික් නාමලේඛනය උපලේඛන I ලෙස දක්වා ඇත. පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය හා එහි අංකය උපලේඛන I අනුව අයදුම්පතේ නිවැරදිව සඳහන් කළ යුතුය.

(ආ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම්කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජූලි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

(ii) පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කරගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරනු ලැබේ.

(iii) විභාගයේදී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරාගැනීම සිදු නොකෙරේ.

(ඇ) දිස්ත්‍රික්කයට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයට පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

(i) අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය.

එසේ නැතහොත්,

(ii) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතුය.

එසේ නැතහොත්,

(iii) ඔහු නොකඩවා අවුරුදු පහක් (05) එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

සටහන :

යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටි නම්, එම අපේක්ෂකයාට තම මව හෝ පියා හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රාජ්‍ය සේවයේ නිරත වන බැව් සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කළ යුතුය.)

ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවකදී ඉහත දිස්ත්‍රික්කයට අයත්වීම සනාථ කෙරෙන පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

(i) උප්පැන්න සහතිකය

(ii) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය හෝ අවුරුදු 03ක අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාම ලේඛනය

(iii) ශිෂ්‍ය කාර්ය දර්ශන

(iv) කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි අයදුම්පතෙහි සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

9.0 විභාග පරිපාටිය :

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2 යි |
| (ii) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

භාෂා හැකියාව : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

අභියෝග්‍යතාව : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

සටහන -

(අ) රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ආ) සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ඇ) මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ලබා ගත යුතුවේ. බඳවා ගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

(ඈ) විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවියේ පළ කිරීම මගින් සිදු කෙරෙනු ඇත.

10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වීමේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.0 විභාග ගාස්තු :

(අ) විභාග ගාස්තුව රු. 600 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Any bank debit card with internet transaction facilities)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Slip Payments)
v. තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post Office)

සටහන - ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

12.0 අයදුම් කිරීම සහ අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ. යු. (i) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයන් ගණනක් නොසිටිය හොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ. විභාගය පවත්වන නගරය පිළිබඳ අවසාන තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

(ii) තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ අයදුම්පතේ සටහන් කරනු ලබන සම්පූර්ණ නමට පමණක් වන බැවින් නම නිවැරදිව සඳහන් කළ යුතුය. පත්වීම නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

(iii) විභාගය සඳහා වූ අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන මෙම නිවේදනයේ 13(ඇ) හි සඳහන් තත්වයක් දරන අයකු ලවා සහතික කර තිබිය යුතුය.

(iv) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත විභාග ගාස්තුව ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙසට සලකනු නොලැබේ. ගැසට් නිවේදනය අනුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එහිදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 විභාගයට පෙනී සිටීම :

(අ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.

(ආ) එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කළ ඉහත විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

(ඇ) අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා හෝ සහතික කරවාගත යුතුය. තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

14.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15.0 අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 මෙම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 ක් වූ ජුනි මස 29 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

උපලේඛනය - I

දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| | | |
|---|---|---|
| 01. | කොළඹ | 01 |
| 02. | ගම්පහ | 02 |
| 03. | කළුතර | 03 |
| 04. | මහනුවර | 04 |
| 05. | මාතලේ | 05 |
| 06. | නුවරඑළිය | 06 |
| 07. | ගාල්ල | 07 |
| 08. | මාතර | 08 |
| 09. | හම්බන්තොට | 09 |
| 10. | යාපනය | 10 |
| 11. | මන්නාරම | 11 |
| 12. | වව්නියාව | 12 |
| 13. | මුලතිව් | 13 |
| 14. | කිලිනොච්චිය | 14 |
| 15. | මඩකලපුව | 15 |
| 16. | අම්පාර | 16 |
| 17. | ත්‍රිකුණාමලය | 17 |
| 18. | කුරුණෑගල | 18 |
| 19. | පුත්තලම | 19 |
| 20. | අනුරාධපුර | 20 |
| 21. | පොළොන්නරුව | 21 |
| 22. | බදුල්ල | 22 |
| 23. | මොනරාගල | 23 |
| 24. | රත්නපුර | 24 |
| 25. | කෑගල්ල | 25 |

උපලේඛනය - II

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| | දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| 01. | කොළඹ | කොටහේන | 01 |
| | | මරදාන | 02 |
| | | බොරැල්ල | 03 |
| | | කුරුඳුවත්ත | 04 |
| | | බම්බලපිටිය | 05 |
| | | හැව්ලොක් ටවුන් | 06 |
| | | නුගේගොඩ | 07 |
| | | මොරටුව | 08 |
| | | පිළියන්දල | 09 |
| | | මහරගම | 10 |
| | | හංවැල්ල | 11 |
| | | අවිස්සාවේල්ල | 12 |
| | | හෝමාගම | 13 |
| 02. | ගම්පහ | මීගමුව | 14 |
| | | මිනුවන්ගොඩ | 15 |
| | | දිවුලපිටිය | 16 |
| | | වේයන්ගොඩ | 17 |
| | | ගම්පහ | 18 |
| | | ජා-ඇල | 19 |
| | | වත්තල | 20 |
| | | කැලණිය | 21 |
| | | දොම්පේ | 22 |
| 03. | කළුතර | හොරණ | 23 |
| | | පානදුර | 24 |
| | | කළුතර | 25 |
| | | මතුගම | 26 |
| | | අලුත්ගම | 27 |
| 04. | මහනුවර | මහනුවර | 28 |
| | | කටුගස්තොට | 29 |
| | | තෙල්දෙණිය | 30 |
| | | වත්තේගම | 31 |
| | | නුගවෙල | 32 |
| | | ගලගෙදර | 33 |
| | | ගම්පොල | 34 |
| 05. | මාතලේ | මාතලේ | 35 |
| | | ගලේවෙල | 36 |
| | | නාඋල | 37 |
| | | ලග්ගල - පල්ලෙගම | 38 |
| 06. | නුවරඑළිය | හැඳුනුවැව | 39 |
| | | නුවරඑළිය | 40 |
| | | වතුමුල්ල | 41 |
| | | හැටන් | 42 |
| | | ගිනිගත්හේන | 43 |
| 07. | ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | | ගාල්ල | 45 |
| | | බද්දේගම | 46 |
| 08. | මාතර | වැලිගම | 47 |
| | | මාතර | 48 |
| | | කඹුරුපිටිය | 49 |
| | | හක්මන | 50 |
| | | දෙයියන්දර | 51 |
| | | දික්වැල්ල | 52 |
| | | අකුරැස්ස | 53 |
| | | කොටපොළ | 54 |
| 09. | හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | | වලස්මුල්ල | 56 |
| | | වීරකැටිය | 57 |
| | | තංගල්ල | 58 |
| | | අම්බලන්තොට | 59 |
| | | හම්බන්තොට | 60 |
| | | තිස්සමහාරාම | 61 |
| 10. | යාපනය | චාවකච්චේරි | 62 |
| | | යාපනය | 63 |
| | | තෙලිප්පලෙයි | 64 |
| | | පේදුරුතුඩුව | 65 |
| 11. | මන්නාරම | මන්නාරම | 66 |
| | | මුරුක්කන් | 67 |
| 12. | වවුනියාව | වවුනියාව | 68 |
| 13. | මුලතිව් | මුලතිව් | 69 |
| 14. | කිලිනොච්චිය | කිලිනොච්චිය | 70 |
| | | පලෙයි | 71 |
| 15. | මඩකලපුව | මඩකලපුව | 72 |
| | | එරාවූර් | 73 |
| | | කාත්තන්කුඩි | 74 |
| 16. | අම්පාර | අම්පාර | 75 |
| | | සේරංකඩ | 76 |
| | | කල්මුනේ | 77 |
| | | අක්කරේපත්තු | 78 |
| | | සමන්තුරේ | 79 |
| 17. | ත්‍රිකුණාමලය | කන්තලේ | 80 |
| | | ත්‍රිකුණාමලය | 81 |
| | | මුතූර් | 82 |
| | | පදවි පරාක්‍රමපුර | 83 |
| | | කින්නියා | 84 |
| 18. | කුරුණෑගල | කුලියාපිටිය | 85 |
| | | බිංගිරිය | 86 |
| | | නාරම්මල | 87 |
| | | පොල්ගහවෙල | 88 |
| | | කුරුණෑගල | 89 |
| | | ඉබ්බාගමුව | 90 |
| | | දෙඩම්ගස්ලන්ද | 91 |
| | | මොරතිහ | 92 |
| | | නිකවැරටිය | 93 |
| | | මහව | 94 |
| 19. | පුත්තලම | වෙන්නප්පුව | 95 |
| | | මාදම්පේ | 96 |
| | | හලාවත | 97 |
| | | පුත්තලම | 98 |
| 20. | අනුරාධපුර | මැදවච්චිය | 99 |
| | | කැකිරාව | 100 |
| | | අනුරාධපුර | 101 |
| | | ගලෙන්බිඳුණුවැව | 102 |
| | | කහටගස්දිගිලිය | 103 |
| 21. | පොළොන්නරුව | පොළොන්නරුව | 104 |
| | | හිඟුරක්ගොඩ | 105 |
| 22. | බදුල්ල | බණ්ඩාරවෙල | 106 |
| | | වැලිමඩ | 107 |
| | | බදුල්ල | 108 |
| | | පස්සර | 109 |
| | | මහියංගනය | 110 |
| | | ගිරාඳුරුකෝට්ටේ | 111 |
| | | හසලක | 112 |
| 23. | මොනරාගල | බිබිල | 113 |
| | | මොනරාගල | 114 |
| | | වැල්ලවාය | 115 |
| 24. | රත්නපුර | ඇහැලියගොඩ | 116 |
| | | රත්නපුර | 117 |
| | | පැල්මඩුල්ල | 118 |
| | | බලංගොඩ | 119 |
| | | කලවාන | 120 |
| | | ඇඹිලිපිටිය | 121 |
| 25. | කෑගල්ල | කෑගල්ල | 122 |
| | | රඹුක්කන | 123 |
| | | මාවනැල්ල | 124 |
| | | රුවන්වැල්ල | 125 |

07-169

---

සංශෝධනයයි

**කළමනාකරණ සහකාර (තාක්ෂණ) බණ්ඩ 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (විවෘත/සීමිත) බඳවා ගැනීම -2021**

උක්ත බඳවා ගැනීමට අදළ අංක 2228 හා 2021.05.13 දිනැති ගැසට් නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අයදුම්පත් යොමු කිරීමට නොහැකි වූ අයදුම්කරුවන් හට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2021.07.15 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

03. එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතින බව කාරුණිකව දන්වමි.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2021 ජුනි මස 30 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,
කොළඹ 10.

07-189

---

## අංක 2,236 - 2021 ජූලි මස 09 වැනි සිකුරාදා ගැසට් පත්‍රයේ පළ වූ විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කම්කරු අමාත්‍යාංශය**

කම්කරු දෙපාර්තමේන්තුව

**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2021**

කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කම්කරු දෙපාර්තමේන්තුවෙහි 2021.03.31 පුරප්පාඩුව පවත්නා අධික්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2021.08.13 දිනට පහත 3.0 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ඇඟිළි සටහන් පරීක්ෂක නිලධාරි | 3 |
| 2 | පර්යේෂණ සහකාර | 3 |
| 3 | ගොඩනැගිලි පරීක්ෂක | 3 |
| 4 | සැලසුම් ශිල්පී | 2 |
| 5 | තාක්ෂණ නිලධාරි (සිවිල්) | 1 |
| 6 | තාක්ෂණ නිලධාරි (විදුලි) | 1 |

1.1 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය)

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය

| | අනුමත තනතුරු නාම | කාර්යයන් |
|---|---|---|
| 1 | ඇඟිළි සටහන් පරීක්ෂක නිලධාරි | සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් කටයුතුවලදී අදාළ පුද්ගලයාගේ අනන්‍යතාව තහවුරු කර ගත නොහැකි අවස්ථාවලදී සහ ගෙවිය යුතු මුල්‍යමය වටිනාකම වැඩි අගයක් ගන්නා අවස්ථාවන්හි දී අදාළ අංශයෙන් ඉල්ලීමක් ලද විට පුද්ගලයාගේ අයදුම්පතෙහි සහ A, B, H ආකෘතිවල ඇති ඇඟිළි සටහන් පරික්ෂා කිරීම, ඇඟිළි සටහන් පරික්ෂා කිරීමට පුහුණු කිරීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 2 | පර්යේෂණ සහකාර | සේවා ස්ථානවල පාරිසරික, ජෛවීය සහ ශ්‍රම විද්‍යාත්මක මිනුම් ලබා ගැනීම සඳහා පර්යේෂණ නිලධාරි (වෘත්තීය ස්වස්ථතා) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (වෘත්තීය ස්වස්ථතා) සහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (වෘත්තීය ස්වස්ථතා), යන නිලධාරින්ට සහය වීම, සේවා පරිසරයේ භෞතික මිනුම් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ ක්‍රියාත්මක තත්ත්වය පිළිබද වගකීම, ඒවා නඩත්තු කිරීම සහ සුසර කිරීම, සේවා පරිසරයේ ඇති රසායනික ආපදා නිර්ණය කිරීම සඳහා වායු සාම්පල එක්රැස් කිරීමේ කටයුතු සංවිධානය හා එසේ ලබාගත් වායු සාම්පල පර්යේෂණ සඳහා පිළියෙල කිරීම, විශ්ලේෂණ සඳහා භාවිත කරන සූක්ෂම විද්‍යාගාර උපකරණ නඩත්තුව සහ ඒවා නිසි ලෙස ක්‍රියා කරවීම සඳහා පර්යේෂණ නිලධාරින්ට සහය වීම, සේවා ස්ථානවල සේවයකයන්ගේ ශ්‍රම විද්‍යාත්මක අධ්‍යන කටයුතුවලදී අවශ්‍ය වන ඔවුන්ගේ මානවමිතික මිනුම් ගැනීම හා ඒවා පිළිබඳ විශ්ලේෂණය, අවශ්‍යවන අවස්ථාවක දී යම් සේවා ස්ථානයක සේවකයන්ගේ ශ්‍රවණ සංවේදීතාවය පිළිබඳ පරීක්ෂණ සහ පෙනහළුවල ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ සඳහා පර්යේෂණ නිලධාරින්ට සහය වීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

| | අනුමත තනතුරු නාම | කාර්යයන් |
|---|---|---|
| 3 | ගොඩනැගිලි පරීක්ෂක | කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, කම්කරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය වශයෙන් පිහිටා ඇති කම්කරු කාර්යාලවල අලුත්වැඩියා කටයුතු සහ නව ඉදිකිරීම්වල අධීක්ෂණ කටයුතු, ඇස්තමේන්තු සැකසීම, කොන්ත්‍රාත් කරුවන්ගේ වැඩ පරීක්ෂා කිරීම, ප්‍රමාණ බිල්පත් සකස් කිරීම, කාර්මික නිලධාරීන්ගේ වැඩ අධීක්ෂණය කිරීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 4 | සැලසුම් ශිල්පී | ඉංජිනේරු විසින් සකස් කරන සැලසුම් ඇඳීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 5 | තාක්ෂණ නිලධාරී (සිවිල්) | කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි හා කම්කරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය වශයෙන් පිහිටා ඇති කම්කරු කාර්යාලවල අලුත්වැඩියා කටයුතු සහ නව ඉදිකිරීම්වල අධීක්ෂණ කටයුතු, ඇස්තමේන්තු සැකසීම, කොන්ත්‍රාත් කරුවන්ගේ වැඩ පරීක්ෂා කිරීම, ප්‍රමාණ බිල්පත් සකස් කිරීම, කාර්මික නිලධාරීන්ගේ වැඩ අධීක්ෂණය කිරීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 6 | තාක්ෂණ නිලධාරී (විදුලි) | නව විදුලි පද්ධති සකස් කිරීමට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම, නව වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීමට අදාළව ඇස්තමේන්තු සකස් කිරීම සහ වායු සමීකරණ නඩත්තු හා සේවා කටයුතු, විදුලි පද්ධති පිළිබඳ පරීක්ෂා කර බැලීම, ඉහත කටයුතු නවීකරණයට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම, විදුලි ජනක යන්ත්‍ර පරීක්ෂා කිරීම සහ විදුලි උපකරණවල ඇති වන දෝෂ විදුලි කාර්මික සමග පරීක්ෂා කර ඉංජිනේරු වෙත වාර්තා සැපයීම, ගොඩනැගිල්ලෙහි සවිකර ඇති ගිනි නිවන උපකරණ පිළිබඳ අදාළ කටයුතු පරීක්ෂා කිරීම හා ඒවායේ සේවා කිරීම්වලදී පරීක්ෂා කිරීම, ශබ්ද විකාශන යන්ත්‍ර සහ දුරකථන ජාල පරීක්ෂා කටයුතු සිදු කිරීම, දෙපාර්තමේන්තුව තුල බාහිර ආයතනවලින් කරන විදුලි කාර්මික වැඩ පරීක්ෂා කිරීම, දිස්ත්‍රික් කාර්යාලවල නඩත්තු හා සේවා කටයුතු පරීක්ෂා කිරීම, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

2.0 බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම, අයදුම්කරුවන්ගේ සුදුසුකම් අනුව ශ්‍රේණි 3 කට වෙන් කර ඇත. එනම්, පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය), පුහුණු ශ්‍රේණිය (වසරක පුහුණු කාලය) හා III වන ශ්‍රේණිය (සෘජු බඳවා ගැනීම) වේ. එක් එක් ශ්‍රේණියට අදාළ සුදුසුකම් 3.0 යටතේ දක්වා ඇති අතර අයදුම්කරුවන් විසින් තම අයදුම්පතෙහි පැහැදිලිවම අයදුම් කරන ශ්‍රේණිය කුමක් ද යන්න සඳහන් කළ යුතු වේ.

2.2 ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත මෙම වගන්තිය යටතේ පහතින් දක්වා ඇති කොන්දේසිවලට යටත්ව පළමුව III වන ශ්‍රේණියට ද (සෘජු බඳවා ගැනීමට), දෙවනුව පුහුණු ශ්‍රේණියට (වසරක පුහුණු කාලයකට) ද සහ තෙවනුව පුහුණු ශ්‍රේණියට (දෙවසරක පුහුණු කාලයකට) ද බඳවා ගනු ලැබේ.

2.2.1 ඉහත ශ්‍රේණි තුන අතරින් පළමුව III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ. III වන ශ්‍රේණියට (සෘජු බඳවා ගැනීම) යටතේ අයදුම්කල අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2.2 III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණිය (වසරක පුහුණු කාලයට) යටතේ අයදුම්කළ අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2.3 ඉහත 2.2.1 හා 2.2.2 ට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලයට) අදාළව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

3.0 සුදුසුකම් :

බඳවා ගන්නා ශ්‍රේණිවලට අදාළ සුදුසුකම් පහතින් දක්වා ඇත.

3.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

3.1.1 පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය)

(අ) අධ්‍යාපන සුදුසුකම් :
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

ගණිතය (ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය) /ජීව විද්‍යාව (සත්ව විද්‍යාව/උද්භිද විද්‍යාව), භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ තාක්ෂණවේදය (ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, විද්‍යා තාක්ෂණය) යන විෂයයන්ගෙන් විෂයයන් 2ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

3.1.2 පුහුණු ශ්‍රේණිය : (එක් වසරක පුහුණු කාලය)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

ගණිතය (ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය) /ජීව විද්‍යාව (සත්ව විද්‍යාව/උද්භිද විද්‍යාව), භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 2ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම (උදාහරණ : ජාතික තාක්ෂණ සහතිකය සිවිල්/විදුලි/යාන්ත්‍රික)

හෝ

ii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම

හෝ

iii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම

හෝ

iv. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

3.1.3 III වන ශ්‍රේණිය (සෘජු බඳවා ගැනීම)

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

ගණිතය (ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය)/ජීව විද්‍යාව (සත්ත්ව විද්‍යාව/උද්භිද විද්‍යාව), භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 2ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

පහත සඳහන් සුදුසුකම්වලින් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව.

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින්
පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදළ වෘත්තීය කුසලතා (N.V.Q.) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

3.2 කායික සුදුසුකම්

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3 වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
iv. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු
ලබන්නේ අයදුම්කරු අදළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

4.0 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

5.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කර ගනුලබන අයදුම්කරුවන් කම්කරු කොමාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලබන ආයතනයක අදළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2 පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුන්ට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

5.3 විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධරයෙකු වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. ඔහු/ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදයක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු/ඇය පරිවාස කාලය අවසානයේ ස්ථිර කරනු ලැබේ.

5.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදළ ප්‍රවීනතාවය ලබාගත යුතුය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අංක 1930/12 දරන 2015 සැප්තැම්බර් මස 01 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් පළ කරන ලද සේවා ව්‍යවස්ථාවට හා 2017.03.07 වන දින හා එහි සංශෝධන 2018.03.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට හා සේවා ව්‍යවස්ථාවට මින් මතු කෙරෙන සංශෝධනවලටද මෙම පත්වීම යටත් වේ.

5.6 තෝරාගනු ලබන අයදුම්කරුවන් කොළඹ 05, නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය.

6.0 වැටුප් පරිමාණය

6.1 iii වන ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන 1 අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් ප්‍රමාණය රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 වේ.

6.2 පුහුණු කිරීමේ ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව දීමනාව

1 වසර - රු. 27,140.00
2 වසර - රු. 27,440.00

7.0 ලිඛිත විභාගය :

(අ) ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. | බුද්ධි පරීක්ෂණය | පැය 01 1/2 යි | 100 | 40 |
| 2. | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 2යි | 100 | 40 |

(ආ) සියලුම අපේක්ෂකයින් ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය. බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා සියලුම අපේක්ෂකයින් පෙනී සිටිය යුතු අතර, විෂයානුබද්ධ තාක්ෂණ පරීක්ෂණය අපේක්ෂකයින් විසින් ඉල්ලුම් කරන තනතුර අනුව වෙනස් වන අතර එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය අනු අංක 8.0 මගින් දක්වා ඇත.

(ඇ) පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

(ඈ) අපේක්ෂකයින් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

8.0 ලිඛිත විභාගය සඳහා වන විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | (අ) *ඇඟිලි සටහන් පරීක්ෂක නිලධාරි*<br>i. ඇඟිලි සටහන් විද්‍යාවේ ඉතිහාසය<br>ii. ඇඟිලි සටහන් විද්‍යාවේ පුරෝගාමීන්<br>iii. ඇඟිලි සටහන් පිහිටීම හා එහි ලක්ෂණ<br>iv. ඇඟිලි සටහන් ලබා ගැනීමේ වැදගත්කම<br>v. ඇඟිලි සටහන් මෝස්තර<br>vi. ඇඟිලි සටහන් ලබා ගැනීම<br>vii. පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීමේ ක්‍රම<br>viii. ලිපි ලේඛනවල ඇති මහපට ඇඟිලි සටහන් සසඳා වාර්තා ඉදිරිපත් කිරීම<br>ix. නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඇඟිලි සටහන් සැසඳීමේ ක්‍රම<br>x. ඇඟිලි සටහන් මෝස්තර සහ වැටි ලක්ෂණ<br>xi. ඇඟිලි සටහන් වර්ගීකරණය<br>xii. ඇඟිලි සටහන් සම්බන්ධ නීති<br><br>(ආ) *පර්යේෂණ සහකාර*<br>i. පාරිසරික, ජෛවීය සහ ශ්‍රම විද්‍යාත්මක මිනුම් ලබා ගැනීම පිළිබඳ දැනුම<br>ii. සේවා පරිසරයේ භෞතික මිනුම් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ පිළිබඳ දැනුම<br>iii. පරිසරයේ පවතින රසායනික ද්‍රව්‍ය හා ඒවායේ විෂ විද්‍යාව පිළිබඳ දැනුම<br>iv. කම්පනය, තාපය හා අයනීකාරක හා අයනීකාරක නොවන විකිරණ පිළිබඳ මූලික දැනුම<br>v. විශ්ලේෂණ ක්‍රම මගින් රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම<br>vi. විද්‍යාගාර උපකරණ පිළිබඳ දැනුම<br><br>(ඇ) *ගොඩනැගිලි පරීක්ෂක, තාක්ෂණ නිලධාරි (සිවිල්)*<br>i. ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව පිළිබඳ දැනුම<br>ii. ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු සැකසීම/මිමි ගැනීම හා මට්ටම් ගැනීම පිළිබඳ දැනුම<br><br>(ඈ) *තාක්ෂණ නිලධාරී (විදුලි)*<br>i. විදුලි සැපයුම/විදුලි පරිපථ පිළිබඳ දැනුම<br><br>(ඉ) *සැලසුම් ශිල්පී*<br>i. ඇස්තමේන්තු සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම<br>ii. සැලසුම් ඇඳීම හා උපකාර පිළිබඳ අවබෝධය, ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ දැනුම |

9.0 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.

***සැලකිය යුතුයි*

සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

10.0 විභාග ගාස්තුව :

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 500 කි. එම විභාග ගාස්තුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය නමින් ඇති නාරාහේන්පිට ලංකා බැංකු ශාඛාවේ අංක 0071451995 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය.

(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

| |
|---|
| *සටහන.-* විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. |

11.0 අයදුම්කිරීමේ ක්‍රමය :

11.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය. අංක 1.0 සිට 8.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 09.0 සිට 11.1 දක්වා 02 පිටුවේ ද, අංක 11.2 සිට 12.0 දක්වා 03 පිටුවේ ද, අංක 13.0 සිට 16.0 දක්වා 04 පිටුවේ ද, අංක 17.0, 05 පිටුවේ ද ඇතුලත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

11.2 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

11.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.4 මෙම විභාගය 2021 සැප්තැම්බර් මස 26 වැනි දින කොළඹ නගරයේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ.

11.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

11.6 තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

11.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව ''කම්කරු දෙපාර්තමේන්තුවේ **අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ** ............ තනතුරට බඳවා ගැනීම - විවෘත තරඟ විභාගය'' යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය. (අයදුම් කරන තනතුර හිස්තැනට ඇතුලත් කරන්න.)

11.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල් සතු වන්නේය.

12.0 අයදුම්පත යොමු කිරීම :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2021.08.13 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2 වන මහල
කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05

13.0 විභාගයට පෙනී සිටීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාගය පවත්වන දිනට එනම් 2021.09.26 දිනට සතියකට කලින් ලැබෙන සේ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීමට නියමිත දිනය වන 2021.09.26 දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ඒ බව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දුරකථන අංක 0112786541/0112786542 අමතා දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවූ ලදුපතේ සහ ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, සමඟ ඔබගේ විමසීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

14.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින විෂයයන් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

15.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

යම් අපේක්ෂකයෙකුට මෙම ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගෙ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

16.0 මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ජුනි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවයේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.)

02. 2.1 මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදහරණ : (SILVA A. B. D. P. A.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

03. 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :—————.

3.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0 , ස්ත්‍රී - 1)
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

07. 7.1 උපන් දිනය : වර්ෂය

7.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2021.08.13 දිනට) වයස :

අවුරුදු මාස දින

08. දුරකථන අංකය

09. අයදුම් කරන තනතුර (ඉදිරියෙන් ( ✓ ) ලකුණ යොදන්න)

| අනු අංකය | තනතුරු නාමය | |
|---|---|---|
| 1 | ඇඟිලි සටහන් පරීක්ෂක නිලධාරි | |
| 2 | පර්යේෂණ සහකාර | |
| 3 | ගොඩනැගිලි පරීක්ෂක | |
| 4 | සැලසුම් ශිල්පී | |
| 5 | තාක්ෂණ නිලධාරී (සිවිල්) | |
| 6. | තාක්ෂණ නිලධාරී (විදුලි) | |

10. *ගැසට්* නිවේදනයේ 3.0 ඡේදය අනුව අයදුම් කරන ශ්‍රේණිය (ඉදිරියෙන් ✓ ලකුණ යොදන්න)

| | | |
|---|---|---|
| 1 | පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | |
| 2 | පුහුණු ශ්‍රේණිය (වසරක පුහුණු කාලය) | |
| 3 | iii වන ශ්‍රේණිය (සෘජු බඳවා ගැනීම) | |

11. අධ්‍යාපන සුදුසුකම් :

11.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ : (පළමුවර)

(i) විභාගයේ වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) ප්‍රතිඵල :—————.

| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

11.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ : (දෙවැනිවර)

(i) විභාගයේ වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) ප්‍රතිඵල :—————.

| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

11.3 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ :

(i) විභාගයේ වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) ප්‍රතිඵල :—————.

| | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

12. වෘත්තීය සුදුසුකම් :

| හදරා ඇති පාඨමාලාව | පිරිනමනු ලැබූ ආයතනය | හදරන ලද කාල සීමාව | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳව විස්තර :..........................................................................................
..........................................................................................

14. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටිය දී සේවය අවසන් කර තිබේ ද ?
එසේ නම් එම විස්තර සහ සේවය අවසන් කිරීමට හේතු :
.............................................................. ..............................................................
..............................................................

15. විභාග ගාස්තු ගෙවීම :
15.1 ගෙවූ මුදල :—————.
15.2 ගෙවන ලද බැංකු ශාඛාව :—————.
15.3 ගෙවූ දිනය :—————.

ලදුපත එහි දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

16. අයදුම්කරුගේ සහතිකය :

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව, විවෘත තරග විභාගයට පෙනී සිටීමට . . . . . වන මම සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුලත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කිසිදු වන්දියක් නොගෙවා, මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මම මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට එකග වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (ගැසට් නිවේදනයේ 11.8 ඡේදය පරිදි විය යුතුය)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................. (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ...................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :—————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුය.)

07-120

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම**

2021 ජූලි මස 01 දින සිට 2022 ජුනි මස 30 දක්වා

01.2021 ජූලි මස 01 දින සිට 2022 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. මෙම ප්‍රසම්පාදන පත්‍රයකම ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලින්, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක්ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ අංක . . . . . . . . . . දරන . . . . . . . . . . රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කො 2021.07.19 දින පෙ. ව. 10.00ට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේක්ට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ත්‍රිකුණාමලය නග හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතුය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට ඇතුලත් විය යුතුය.

05. 2021.07.19 වන දින පෙ. ව. 10.00 ට ප්‍රසම්පාදන පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී සියළුම ප්‍රසම්පාදනකරුවන් ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලේ පෙනී සිටිය යුතුය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත් අතුරින් තෝරාගනු ලබන සාර්ථකව ගැණුම්කරු විසින් මාස 02 කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනට ගෙවිය යුතුය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් 2021.07.19 දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා 2021 ජූලි මස 22 දින පෙ. ව. 10.00 දක්වා ප්‍රසම්පාදනපත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාර ගැනීම අවසන් කල වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියළු කොන්දේසි අදළ වන බවද සැලකිය යුතුය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

පී. ධනේෂ්වරන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
නගර හා කඩවත් ත්‍රිකුණාමලය.

2021 ජූලි මස වන දින,
ත්‍රිකුණාමලය නගර හා කඩවත්

| අනු අංකය | කොට්ඨාසය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව | වසන වේලාව | ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල | ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | නො. අංක 01 | විල්ලුන්ඩි අංක 01 | පෙ. ව. 11.00<br>ප. ව. 05.00 | ප. ව. 02.00<br>ප. ව. 08.00 | රු. 3000 | රු. 1000 |
| 02 | තෙක්කලුක්කු සබරගමුව | තෙක්කුලුත්තු අංක 08 | පෙ. ව. 11.00<br>ප. ව. 05.00 | ප. ව. 02.00<br>ප. ව. 08.00 | රු. 1500 | රු. 100 |

07-319

---

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා රේන්ද විකිණීම**

2021 ජූලි මස 01 දින සිට 2022 ජුනි මස 30 දක්වා

01.2021 ජූලි මස 01 දින සිට 2022 ජූනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වන දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. මෙම ප්‍රසම්පාදන පත්‍රයකම ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලින්, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක්ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ අංක . . . . . . . . . . දරන . . . . . . . . . . රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කො 2021.07.19 දින පෙ. ව. 01.00ට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේක්ට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ත්‍රිකුණාමලය නග හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතුය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළවි ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට ඇතුලත් විය යුතුය.

05. 2021.07.19 වන දින ප. ව. 01.00 ට ප්‍රසම්පාදන පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී සියළුම ප්‍රසම්පාදනකරුවන් ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලේ පෙනී සිටිය යුතුය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත් අතුරින් තෝරාගනු ලබන සාර්ථකව ගැණුම්කරු විසින් මාස 02 කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනට ගෙවිය යුතුය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් 2021.07.19 දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා 2021 ජූලි මස 22 දින ප. ව. 01.00 දක්වා ප්‍රසම්පාදනපත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාර ගැනීම අවසන් කල වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියළු කොන්දේසි අදළ වන බවද සැලකිය යුතුය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. එම්. භාතිය විජයන්ත,
ප්‍රාදේශීය ලේකම් (වැඩබැලීම.)

2021 ජූලි මස 05 වන දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුච්චවේලි.

| අනු අංකය | කොට්ඨාසය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව | වසන වේලාව | ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල | ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | කුච්චවේලි | නිලාවේලි අංක 04 | පෙ. ව. 11.00<br>ප. ව. 05.00 | ප. ව. 02.00<br>ප. ව. 08.00 | රු. 3000 | රු. 1000 |

07-328

---

## බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - සම්මන්තුර**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාග වලදී රාජසංතක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2021.07.17වන දින පෙරවරු 9.00ට සම්මන්තුර මහේස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදි ප්‍රසිද්ධ වෙන්දේසි කිරිමට නියමිතය.

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ.ව. 8.00 සිට පෙ.ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරික්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේදී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාර ගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදුකරන අවස්ථාවේදිම ඉදිරිපත් කළයුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගිවීමට කැමති අය සිය ජාතික හැදුනුම්පත හෝ පිළිගතහැකි ලේඛන සමග පැමිණිය යුතුය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රත් අධිකරණය,
සම්මන්තුර

දිනයඃ-2021 ජූලි මස 06 වැනි දින,

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| *අංක* | *නඩු අංකය* | *ලියාපදිංචි අංකය* | *භාණ්ඩ* | *අයිතම ගණන* |
|---|---|---|---|---|
| 1 | 18170/PC/17 | 97-5527 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 2 | 16365/PC/16 | 144-9066 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 3 | 7959/PC/13 | 147-2352 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 4 | 25964/Misc/21 | | වානේ බාල්දිය | 01 |
| 5 | 25622/Misc/21 | | වානේ බාල්දිය | 02 |
| 6 | 25683/Misc/21 | | වානේ බාල්දිය | 01 |
| 7 | 25683/Misc/21 | | සවල් | 01 |
| 8 | 25624/Misc/21 | | වානේ බාල්දිය | 01 |
| 9 | 25624/Misc/21 | | සවල් | 01 |
| 10 | 26016/PHI/21 | | ඇලුමිනියම් කේක් තහඩුව | 02 |
| 11 | 26017/PHI/21 | | ඇලුමිනියම් කේක් තහඩුව | 03 |
| 12 | 26018/PHI/21 | | ඇලුමිනියම් කේක් තහඩුව | 03 |
| 13 | 25778/PHI/21 | | ඇලුමිනියම් කේක් තහඩුව | 05 |
| 14 | 24299/E/20 | | ඇලුමිනියම් වලං | 01 |
| 15 | 20852/PC/18 | | උදැල්ල | 01 |
| 16 | 20852/PC/18 | | මිටිය | 01 |
| 17 | 20852/PC/18 | | අඩුව | 01 |
| 18 | No Number | | වානේ කේක් තහඩුව | 06 |
| 19 | No Number | | ඇලුමිනියම් වලං | 01 |
| 20 | | | ගංගා වැලි | 16 Cube |

07-363

---

## රජයේ නොවන දැන්වීම්

**විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

අංක 231, ''බණ්ඩාර නිවස'', තැපැල් 05 කණුව, මුරුතලාව යන ලිපිනයෙහි පදිංචි සේනානායක රාජපක්ෂ වාසල හිටිරාළහාමිලාගේ ශ්‍රියාරත්න බණ්ඩාර (ජා. හැ. අංක 582453071 V) වන මා විසින් වර්ෂ 2014 ක් වූ අප්‍රේල් මස 10 වන දින රද්දලාන, වෙල්පල්ල පදිංචි අමරපාලි පින්නවල ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද කුරුණෑගල, වයඹ උතුරුමැද කලාප කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලිඛිත බලධාරිකම හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 73 කාණ්ඩයේ 5280 පත් ඉරුවේ 975 දිනපොතේ අංක යටතෙ 2014.04.25 වන දින ලියාපදිංචි කළ විශේෂ ඇටෝර්නි බලපත්‍ර අංක 134 අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මූණමල්දෙණිය, මූණමල්දෙණිය තැපැල් කඩවලගෙදර යන ලිපිනයෙහි පදිංචි පතිරාජ මුදියන්සේලාගේ තමරා දමයන්ති මැණිකේ පතිරාජ (ජා. හැ. අංක 695372914 V) යන අය තවදුරටත් මාගේ ඇටෝර්නි බලකරු නොවන බව ප්‍රකාශ කර සිටිමි.

සේනානායක රාජපක්ෂ වාසල
හිටිරාළහාමිලාගේ ශ්‍රියාරත්න බණ්ඩාර

වර්ෂ 2021 ක් වූ ජුනි මස 23 වැනි දින.

07-181

---

**ඇටෝර්නි බලය අහෝසි කිරීමයි**

දකුණු කොරියාවේ Chungnam - Do. Dagin -Si, Myeong. Sinpyong, Sinpyong Kil. 225 - 132 Sunjin Corporation හි රැකියාව කළ දැනට අංක 32 කාසිවත්ත පුර, පොල්හේන, මාතර ලිපිනයැති ජා. හැ. අංක 862594576V හිමි ඉලන්දරි පුරගේ රංගන දිල්හාන් වන මවිසින් දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නයෝමි සේරසිංහ මහත්මිය 2019.11.23 දින සහතික කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මොරවක කොඩිකාරගොඩ, ''ජයමිණ'' හි පදිංචි ජා. හැ. ප. අංක 948212862V හිමි බටගොඩගේ චංචලා ආශිංකා මහත්මියට ලබා දුන් විශේෂ ඇටෝර්නි බලය වර්ෂ 2021.06.23 දිනයෙන් පසු අහෝසි වන බව සියල්ලෝම දැනගනිත්වා.

ඉලන්දරි පුරගේ රංගන දිල්හාන්

07-311

**පුද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම**
**පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (i) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | එච්ටි ලංකා (පුද්ගලික) සමාගම |
| ලියාපදිංචි අංකය | : | පීවී 00240246 |
| ලියාපදිංචි දිනය | : | වර්ෂ 2021ක් වූ ජුනි මස 01 වැනි දින |
| ලියාපදිංචි ලිපිනය | : | අංක 10/29, ඉඩම මාවත, විජයකුමාරණතුංග මාවත, කොළඹ 05, තිඹිරිගස්යාය |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්දිකා ශිරෝමනී සේදර හෙට්ටිගේ
සමාගම් ලේකම්

07-190

---

**මෙට්‍රෝපොලිටන් ඇඩ්වාන්ස්ට් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩුකිරීම

නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයේ කිසිදු වෙනසක් නොමැතිව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වන වගන්තියේ ප්‍රතිපාදන සමග කියවිය යුතු සාංගමික ව්‍යවස්ථාවලියේ 14(2) ව්‍යවස්ථාවට අනුකූලව සාමාන්‍ය ඡන්ද හිමි කොටස් අසූ හත් ලක්ෂ නව දහස් දෙසිය අසූ හතර (8,709,284) කින් හා ඡන්ද හිමි නොවන සාමාන්‍ය කොටස් පන් කෝටි දහ තුන් ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය විසි හත (51,377,127) කින් නියෝජනය වූ රුපියල් හැට කෝටි අට ලක්ෂ හැට හතර දහස් එකසිය දහයක (රු. 600,864,110) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග ්ධනය රුපියල් දහ හත් කෝටි අසූ එක් ලක්ෂ අනූ හතර දහස් එකසිය දොළහ (රු.178,194,112) දක්වා අඩු කිරීමට සිය කොටස්කරුවන්ට නිර්දේශ කිරීමට මොට්‍රෝපොලිටන් ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (''සමාගම'') හි අධ්‍යක්‍ෂ මණ්ඩලය යෝජනා කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2021 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය නොකරන ලද ගිණුම්ප්‍රකාශවලින් පිළිබිඹුවන පරිදි සමාගමේ ගණනය කරන ලද පාඩු, ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් රුපියල් හතලිස් දෙකෝටි විසි හය ලක්‍ෂ හැට නව දහස් නවසිය අනූ අටක් දක්වා (රු. 422,699,998) හිලව් කිරීම මගින් ඉහත සඳහන් අඩු කිරීම ක්‍රියාත්මක කෙරෙනු ඇත.

විශේෂ යෝජනාවක් මගින්, යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩුකිරීම සඳහා කොටස්කරුවන්ගේ අවසරය ලබාගැනීමේ කාර්යය වෙනුවෙන් සමාගමේ විශේෂ මහ සභා රැස්වීමක් කැඳවීමට නියමිතය.

මෙට්‍රෝපොලිටන් ඇඩ්වාන්ස්ඩ් ටෙක්නොලොජීස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,

(අත්/කළේ) ලසන්ති අබයකෝන්,
සමාගම් ලේකම්වරු,
පී. ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවෙට් ලිමිටඩ්)

2021 ජුනි මස 25 වන දින දී ය.

07-129

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුදා දිනට පෙර දැනුම් දිය යුතුය.**

I : I ඡේදය සහ I කොටස : II(B) ඡේදය යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2021.07.09 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk